**ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව**
**----------------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
----------------

1.1 **තත්ත්වාගණනය නොකළ මතය**
**------------------------------------**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**
**------------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
**------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය තුලදී රු.මිලියන 84.2 ක අග්‍රිම ඉල්ලුම් කිරීම සඳහා සැලසුම් කර රු.මිලියන 100.6 ක් ඉල්ලුම් කර තිබුණු නමුත් භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තුවට නිකුත් කර තිබුණු අග්‍රිමය රු.මිලියන 81 ක් විය. | අග්‍රිමය නිසි පරිදි සැලසුම් කිරීම හා කළමනාකරණය කළයුතු වීම. | එක් එක් මාසයට අදාලව අග්‍රිමය සැලසුම් කලද සියළුම වියදම් සැලසුම් කල මාසයේම ඉදිරිපත් නොවන බැවින් හා අදාල ඉන්වොයිස්පත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවීම ද දෙපාර්තමේන්තුවට පාලනය කල නොහැකි තත්ත්වයක් බැවින් මෙම වෙනස්කම් සිදුවන බවද වැඩිදුරටත් දන්වමි. |

**2.2 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූලධන වියදම් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 55 ක් විය. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල කිරීමට කටයුතු කළයුතු වීම. | අපේක්ෂා කළ පරිදි පරිගණක දත්ත පද්ධතිය සකස් නොකිරීම, කාර්යාලීය ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය හා කාර්යාල උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය නොවීම. |
| (ආ) වැය විෂයයන් 02 ක් සඳහා වාර්ෂික ප්‍රතිපාදන වලට අමතරව පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ 66 මාරුකිරීම් යටතේ පිළිවෙලින් සියයට 105 ක් හා සියයට 145 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. | - එම - | ඇස්තමේන්තු කල ප්‍රමාණයට වඩා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත විදේශ පුහුණු අවස්ථා ලැබීම සහ නිල වාහන ලබා ගත හැකි නිලධාරීන් තම පෞද්ගලික වාහන භාවිතා කිරීම වෙනුවෙන් ඔවුන් වෙත ගෙවිය යුතු ප්‍රවාහන දීමනා ගෙවීමට අමතර ප්‍රතිපාදන සපයා ගැනීමට සිදුවීම. |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බැරකම් පිළිබඳ ප්‍රකාශය සහ 2018 වර්ෂයෙහි ගෙවීම් වවුචර් අනුව වැය විෂයයන් 05 ක රු.58,011 ක වෙනසක් විය. | සියලු බැරකම් ඇතුළත් කර ලේඛනය පවත්වා ගත යුතු වීම. | ඉදිරියේ දී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ විශ්වවිද්‍යාලවල අධ්‍යයන, අනධ්‍යයන හා අධ්‍යයන සහය සේවා සඳහා බඳවා ගැනීමේ පටිපාටි අනුමත කිරීම ඇතුළත් වී තිබුණද 2019 මැයි වනවිටත් ඒවා අනුමත කර නොතිබුණි. | අදාළ බඳවා ගැනීමේ පටිපාටි අනුමත කිරීම කළ යුතු වීම | ඒ සම්බන්ධයෙන් අධ්‍යයන කර අනුමත කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. |
| (ආ) ව්‍යවස්ථාපිත මණ්ඩල වල කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තා වලට අදාලව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා නොතිබුණි. | දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර පවත්වා ගත යුතු වීම. | පිළිතුරු සපයා නොමැත. |
| (ඇ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල අනුමත කිරීමට අදාල නිර්ණායක සකස් කර නොතිබුණි. | කාර්ය මණ්ඩල අනුමත කිරීමට අදාළව සකස් කරනු ලබන නිර්ණායක විධිමත් පරිදි ගොනුගත කර පවත්වා ගත යුතු වීම. | අමාත්‍ය මණ්ඩලය විසින් විටින් විට ගනු ලබන ප්‍රතිපත්තිමය කරුණු මත නිර්ණායක නිරන්තරයෙන් සංශෝධනය කිරීමට සිදුවීම නිසා නිර්ණායක ප්‍රමාදයකින් තොරව සකස් කිරීමට නොහැකිවී ඇත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනා ගැනීම හා ළඟා කර ගැනීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කළ යුතු වුවද එම අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇති බවට තහවුරු නොවිණි. | තිරසර සංවර්ධන අරමුණු කඩිනමින් ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ අදාල තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමට අවශ්‍යවන සැලසුම් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |